ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අවසාන පරීක්ෂණය 2004/2005

දෙවන අධ්‍යයන වාරය

453

**ESP 1205 - තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටළු**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.16 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

**I** වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් **II** කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමය කෙරෙහි බලපෑ සාධක තුනක් දක්වන්න.

02. (i) ලන්දේසීන් විසින් අධ්‍යාපනය සඳහා ස්ථාපිත කරන ලද ප්‍රධාන පරිපාලන ආයතනය නම් කරන්න.

    (ii) අධ්‍යාපනය කෙරෙහි රජය දැරූ සෘජු වගකීම පෙන්වන මෙම ආයතනයේ ප්‍රධාන කාර්යන් දෙකක් දක්වන්න.

03. 1867 මෝර්ගන් කොමිසම විසින් ඉදිරිපත් කළ නිර්දේශ පහක් දක්වන්න.

04. ග්‍රාමීය ප්‍රදේශවලට ගුණාත්මක අධ්‍යාපනයක් ව්‍යාප්ත කිරීම සඳහා 1940 දී පිහිටුවන ලද මධ්‍ය මහා විද්‍යාල වල ඇති කළ අංග හතරක් කෙටියෙන් පැහැදිළි කරන්න.

05. 1998 දී ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වා දෙනු ලැබූ විෂයමාලාව හා බැඳුණු ප්‍රතිසංස්කරණ පහක් දක්වන්න.

06. දකුණු අප්‍රිකාවේ අධ්‍යාපනයේ විභේදන ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට යොදා ගත් පනත් මොනවා ද?

07. 1944 බට්ලර් පනත මගින් හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ තුන නම් කරන්න.

08. ප්‍රාථමික අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන අභියෝග හතරක් දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. 'ප්‍රාථමික පාසලේ අධ්‍යාපන මාධ්‍යය මව්බස විය යුතු අතර මාධ්‍යය ඉංග්‍රීසි නොවන සියලුම පාසල් වල ප්‍රාථමික අංශයේ එය විෂයයක් ලෙස හඳුන්වා දිය යුතුය.'

1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව විසින් ඉහත නිර්දේශය පනවන ලදී.

i. අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව විසින් ඉහත නිර්දේශය පැනවූයේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලාංකීය සමාජය කෙරෙහි ඇති වූ බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

10. '1972 දී ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ ද්විතීයික පාසල් මට්ටමේ ඇති කරන ලද විෂයමාලා ප්‍රතිසංස්කරණ වරින් වර පැන නගින අධ්‍යාපනික හා ආර්ථික ගැටළු විසඳීම සඳහා ඉදිරිපත් කළ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස කැපී පෙනෙයි.'

(i) ඉහත විෂයමාලා ප්‍රතිසංස්කරණ වල වැදගත් වූ නව අංග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(ii) එවකට ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපනික හා ආර්ථික ගැටළු විසඳීමට මෙම ප්‍රතිසංස්කරණ හේතු වූ ආකාරය විමර්ශනාත්මකව අගයන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

11. අධ්‍යාපනයෙහි,

(i) සාධාරණත්වය

හා

(ii) අදාලත්වය

පිළිබඳ ගැටළු විසඳීමට එක්සත් රාජධානිය ගෙන ඇති පියවර සාකච්ඡා කරන්න.

(i) ලකුණු 10

(ii) ලකුණු 10

(මුළු ලකුණු 20)

12. (i) මෑත දශක තුළ අධ්‍යාපනයෙහි ජාත්‍යන්තර බලපෑම් තීව්‍ර කිරීමට හේතු වූ සාධක හතරක් පැහැදිලි කරන්න.

(ලකුණු 2x 4 = 08)

(ii) මෙම වඩාත් ප්‍රබල ජාත්‍යන්තර බලපෑම් නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි තුනක් හා අවාසි තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 2x 6 = 12)

(මුළු ලකුණු 20)

13. (i) ශ්‍රී ලංකාවේ විරැකියා ප්‍රශ්නයට විධිමත් පාසල් අධ්‍යාපනය කෙතෙක් දුරට වගකිව යුතු දැයි විභාග කරන්න.

(ලකුණු 10)

(ii) විධිමත් පාසල් අධ්‍යාපනය වැඩ ලෝකය හා ගලපාලීමට ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවා ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

14. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දකුණු ආසියා කලාපයේ අධ්‍යාපන ප්‍රවේශය (access) පිළිබඳ ගැටළු.

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනයෙහි අභ්‍යන්තර කාර්යක්ෂමතාව හීන වීමට බලපාන සාධක

(iii) ඇමරිකා එක්සත් ජනපදයේ ද්විභාෂා අධ්‍යාපනය

(ලකුණු 10 x 2 = 20)

(මුළු ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -